මහර ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 15 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1. 3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි 07 ක වටිනාකම රු.179,111 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කළයුතු වේ. | මිල්ලගහවත්ත ඉඩම ගිණුම්ගතකර නොමැති බැවින් නිවැරදි හඳුනාගැනීමකින් පසු ගිණුම්ගතකිරීමට කටයුතු කරමි. |
| (ආ) | සේවකයින් 16 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයකරගැනීමට තිබූ රු.105,156 ක් ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වේ. | 2020 අවසන් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2018 වර්ෂයේදී ගිවිසුම්ගත නොවූ කර්මාන්තයක ණයහිමි ලෙස වෙන්කල රු.181,971 නිවැරදිකර නොතිබුණි. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වේ. | 2020 අවසන් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.2 **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.426,211,378 ක් වූ ගිණුම් 09 ක් සඳහා අවශ්‍ය තොරතුරු | පෙන්වා දී ඇති විගණන සාක්ෂි | 2020 අවසන් ගිණුමේ නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | |
|---|---|
| විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | විගණනය සඳහා ගිණුම් සමග ඉදිරිපත් කළයුතු වේ. |

1.4 **අනුකූල නොවීම්**

--------------------

1.4.1 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24(1) ආ වගන්තිය | සභා බල ප්‍රදේශයට අයත් නව මංමාවත් සම්බන්ධ සමීක්ෂණයක් සිදුකොට නාමලේඛනයක් ගැසට්පත්‍රයක් මගින් පලකර නොතිබුණි. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | (i) 571 (1) | වසර දෙක ඉකුත්වූ පොදු තැන්පතු රු.1,800,240 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මෙම වර්ෂයේ සිට ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| | (ii) 371 | 2004 හා 2005 වර්ෂවලට අදාල මැතිවරණ ගමන් වියදම් අත්තිකාරම් රු.97,910 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ලේඛනගත සාක්ෂි විනාශකර ඇති බැවින් එම තොරතුරු ලබාදිය නොහැක. |

1.5 **නිරවුල් නොවූ ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගිණුම් අනුව වර්ෂ ගණනාවක සිට පැවත එන රු.873,685 ක් වූ ශේෂ 13 නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | නිවැරදි කිරීමට හැකි අයිතම හා අනුමැතිය ලබාගතයුතු අයිතම වෙන්කොට ගිණුම නිවැරදි කිරීමට කටයුතු සකස්කර ඇත. |

1.6 **ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වර්ෂ 3 ත් 5 ත් අතර රු.2,326,591ක ණයගැති ශේෂයක් හා වර්ෂ 1 ත් 3 ත් අතර රු.40,251,120 ක ණයගැති ශේෂයක් පැවතුණි. | ලැබියයුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | ශේෂයන් තහවුරු කරගෙන ගිණුම් ගලපමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වර්ෂ 3 ත් 5 ත් අතර රු.47,555,076 ක ණයහිමි ශේෂයක් හා වර්ෂ 1 ත් 5 ත් අතර රු.42,898,769 ක ණයහිමි ශේෂයක් පැවතුණි. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ශේෂයන් තහවුරු කරගෙන ගිණුම් ගලපමින් පවතී. |
| (ඇ) | මහර උප කාර්යාලයට අදාල ගෙවල් කුලී ලෙස 1989 සිට 2017 දක්වා රු.620,582 ක මුදලක් තැන්පතු ලෙස දිගින් දිගටම පැවතුණි. | නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ගෙවල් කුලී තැන්පත් ලබාගන්නා ලෙස හිමිකරුවන්ට දන්වා ඇත. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.38,761,396 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.79,033,746 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,298,750 | 10,912,623 | 11,363,697 | 3,906,604 | 11,086,300 | 11,640,113 | 11,353,520 | 4,248,493 |
| කුලී | 4,565,000 | 5,086,821 | 5,167,921 | 9,500 | 6,920,000 | 6,901,084 | 6,953,014 | -1,986,894 |
| බලපත්‍ර ගාස්තු | 2,462,150 | 1,972,646 | 1,971,646 | 14,500 | 2,580,400 | 2,262,157 | 2,263,157 | -237,664 |
| වෙනත් ආදායම් | 325,929,000 | 266,074,507 | 262,315,889 | 493,371 | 150,457,000 | 262,642,532 | 262,698,167 | 505,350 |
| | 346,254,900 | 284,046,597 | 280,819,153 | 4,423,975 | 171,043,700 | 283,445,886 | 283,267,858 | 2,529,285 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රු.3,238,829 ක් වූ වරිපනම් හිඟය අයකරගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාර පියවර ගෙන නොතිබුණි. | හිඟහිටි ආදායම් අයකිරීමේ ක්‍රියාමාර්ග ගතයුතු වේ. | හිඟ වරිපනම් ගෙවන ලෙසත් පනත ප්‍රකාරව කටයුතු කරන බවත් දැන්වීම් කර ඇත. |
| (ආ) | මහර උප කාර්යාලයේ ව්‍යාපාර 34 කින් අයවියයුතු ව්‍යාපාර හා කර්මාන්ත බදු රු.75,200 ක් විය. | හිඟ බදු අයකිරීමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කළයුතු වේ. | ව්‍යාපාරිකයන්ට නඩු පැවරීමට කටයුතු කර ඇත. |

### 2.2.3 සම්ප්‍රේෂණ කුළුණු ආදායම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උප කාර්යාල 03 හි හිඟය රු.42,000 ක් විය. | හිඟ ශේෂ නොපමාව අයකළයුතු වේ. | නොපමාව අදාල හිඟ මුදල් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා සියල්ලම ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා 04 ක් පනවාගෙන නොතිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා ඉදිරියේදී පනවා ගැනීමට නියමිතය. |

(ආ) **අත්හැර දැමූ කර්තව්‍යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී සභාවට ලැබුණු ව්‍යාපෘති 170 ක් කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් අතහැර දැමීමට සිදුවී තිබුණි. | නිසි ඇගයීමකින් පසුව සැලසුම් සකස්කළයුතු වේ. | කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම හා ප්‍රජා සමිති ඉදිරිපත් නොවීම මත අත්හැරදැමීමට සිදුවිය. |

(ඇ) **පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් අක්‍රමවත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා සභා බල ප්‍රදේශයේ කර්මාන්ත වලින් පරිසරයට හානි සිදුවීම නිසා පරිසර දූෂණය සම්බන්ධව ලැබුණු පැමිණිලි 11 ක්, කැළි කසළ පැමිණිලි 08 ක් හා මහජන පැමිණිලි 437 ක් විසඳා නොතිබුණි. | මහජන පැමිණිලි නොපමාව නිරාකරණය කළයුතු වේ. | ගැටළු නිරාකරණය කරගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත. |

(ඉ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් පිළියෙලකර නොතිබුණත් 2019 දෙසැම්බර් 27 දින අඩු ආදායම්ලාභී ස්වයං රැකියාවල නියුතු පවුල් 06 ක් සඳහා රු.292,230 ක් වටිනාකමැති ජූකී මැෂින් 06 ක් පමණක් ලබාදී තිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු වේ. | අඩු ආදායම් ලාභී පවුල් 06 කට ජූකී මැෂින් ලබාදී ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට මාර්ග ඉන්වෙන්ට්‍රිය අනුව බල ප්‍රදේශය තුල ඇති සියළු මාර්ග සංඛ්‍යාව 7943 ක් වුවද, ඉන් 2018 දෙසැම්බර් 31 වන විට ගැසට්කර ඇත්තේ මාර්ග 24 ක් හා පිඹුරුපත් කීපයකි. 2019 වර්ෂයේ කිසිම මාර්ගයක් ගැසට් කිරීම හෝ පිඹුරුපත් සැකසීම සිදුකර නොතිබුණි. | සියළුම මාර්ග සඳහා පිඹුරුපත් සකස්කර ගැසට් කිරීමට පියවර ගතයුතු වේ. | විශාල පිරිවැයක් දැරීම නිසා මාර්ග 10 බැගින් තෝරාගෙන ගැසට් කිරීමට යෝජනා වී ඇත. |
| (ආ) | මියගිය නිලධාරියෙකුගෙන් පෙර වසර වල සිට අයවියයුතු ආපදා ණය ශේෂය රු.98,654 ක් විය | අයවියයුතු ආපදා ණය නොපමාව අයකර ගතයුතු වේ. | ණය මුදල අයකරගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

**වරිපනම් / දේපල තක්සේරු කාලානුරූපීයව සිදු නොකිරීම.**

---------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| බල ප්‍රදේශයේ නිශ්චල දේපල තක්සේරුව සිදුකර වර්ෂ 10 ක් ඉක්මගොස් තිබුණු අතර නව වරිපනම් බදු තක්සේරුවක් 2012 වර්ෂයේ සිදුකලද එය මෙතෙක් ක්‍රියාත්මක නොවීම නිසා බල ප්‍රදේශයට අයත් දේපල 12,988 කින් වර්තමානයට සුදුසු ප්‍රතිශෝධිත තක්සේරු වටිනාකම් මත බදු අයකර නොතිබුණි. | නව තක්සේරුවට අනුව වරිපනම් අයකළයුතු වේ. | 2021 වර්ෂයේ නව තක්සේරුව ක්‍රියාත්මක කළ හැක. |

3.4 **වත්කම් කළමනාකරණය**

--------------------------------

3.4.1 **පොදු පහසුකම් ඉඩම්**

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (ඇ) | නුවර පාරේ කිරිල්ලවල පවතින පර්චස් 4.5 ක ඉඩම සංවර්ධන හෝ වාණිජමය කටයුත්තකට යොදාගෙන නොතිබුණි. | මෙම ඉඩම සභාවට ආදායම ලබාගතහැකි පරිදි සංවර්ධනය කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී සංවර්ධන කටයුත්තක් සඳහා යොදාගැනීමට යෝජනා වී ඇත. |

3.4.2 **වාර්ෂික භාණ්ඩ / තොග පරීක්ෂණය**

---------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව රු.70,667 ක් වටිනා පොත් 423 ක් අස්ථානගතවී තිබුණු අතර රු.177,105 ක් වටිනා පොත් 600 ක් සාමාජිකයින් හා නිලධාරීන් විසින් රැගෙන ගොස් නැවත භාරදී නොතිබුණි. | පොත් අස්ථානගතවීම් සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | අස්ථානගතවී ඇති පොත් ගෙන්වාගැනීමට හා චක්‍රලේඛ පරිදි කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට පුස්තකාල සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව රු.123,972 ක් වටිනා පොත් 848 ක් සමීක්ෂණයට ඉදිරිපත්කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී චක්‍රලේඛ පරිදි කටයුතු කරන බව දන්වා ඇත. |

3.5 **ප්‍රසම්පාදනය**

-----------------

3.5.1 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන ඒජන්සි චක්‍රලේඛ අංක 8 හි 4.2.1 (b) හා (c) පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික විස්තරාත්මක සැලැස්ම පිළියෙලකර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළයුතු වේ. | ඉදිරි වර්ෂය සඳහා පිළිලෙකර ඉදිරිපත් කරමි. |